# ජනාධිපතිවරණය 2

බොහෝ දෙනා බලාපොරොත්තුවෙන් සිටි අන්දමට ජනාධිපතිවරණය පාර්ලිමේන්තු මැතිවරණයට කලින් පැවැත්වෙන බව ප්‍රකාශ කෙරී ඇත. ජනවාරි මස 23 වැනි දා පැවැත්වෙන ජනාධිපතිවරණයෙන් ජයගන්නේ කවු දැයි යන්න දැනගැනීමට අංජනම් එළි බැලීමක් අවශ්‍ය නො වේ. වෙනත් කවුරු තරග කළත් මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය වැළැක්විය හැකි නො වේ. අද ඒ මහතාට ඇති පිළිගැනීම ලංකාවේ වෙනත් කිසිම රාජ්‍ය නායකයකුට නොමැති වූ බව පැහැදිලි ය.

විරුද්ධ පක්ෂයේ ඊනියා පොදු අපේක්ෂකයා තෝරා ගැනීම දින කිහිපයකින් කල්දැමීමට සිදු වී ඇත. ජනාධිපතිවරණය පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් වී පැය විසිහතරක් ඇතුළත පොදු අපේක්ෂකයා කවුරුන් දැයි නම් කෙරෙන බවට විපක්ෂයේ සංධානය ප්‍රකාශ කර තිබූ නමුත් මේ ලිපිය ලියන මොහොත වන තෙක් ම ඒ සිදු වී නැත. ඇතැම් විට පත්‍රය මුද්‍රණය කරන අවස්ථාව වන විට පොදු අපේක්ෂකයා නම් කෙරී තිබෙනු ඇත.

කලින් බලාපොරොත්තු වූ ආකාරයට ඊනියා පොදු අපේක්ෂකයා තෝරා ගැනීමට නොහැකි වීමෙන් පෙන්නුම් කරන්නේ විපක්ෂයේ ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ සංධානයෙහි පොදු එකඟත්වයක් නොමැති බව ය. එ ජා පක්ෂයේ පවා පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කිරීම පිළිබඳ  මතභේද පැන නැගී ඇත. අවසාන මොහොතේ දී වුවත්  සරත් ෆොන්සේකා මහතා තරගයෙන් ඉවත් වනු දැකීම අපේ පැතුම වෙයි. තමන් ඉදිරිපත් වන්නේ කාගේ කඳවුරෙන් ද යන්න පිළිබඳ ව ගොන්සේකා මහතාට තවමත් අවබෝධයක් නැත්නම් ඒ ජාතික බලවේගවල අවාසනාවකි.

දේශපාලනයේ දී අවාසනාවක් ආදී වචනවල තේරුමක් නැතැයි කිසිවකුට කිව හැකි ය. අවාසනාව ද යම් කිසි හේතුවක ප්‍රතිඵලයක් යැයි ඔවුන් කියනු ඇත. එහෙත් සරත් ෆොන්සේකා මහතා ජාතික බලවේගයෙන් ඉවත්වීම පිළිබඳ සියළු කරුණු අප නොදන්නා බැවින් දැනට ඒ ගැන පැවසිය හැක්කේ එපමණ ය. ඇතැම් විට ජනාධිපතිවරණයට විශ්‍රාමික ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා ඉදිරිපත් වුවහොත් මේ කරුණු කවරේදැයි අනාවරණය වනු ඇත.

එහෙත් කිවයුත්තක් වෙයි. කිනම් හේතුවක් නිසා වුව ද ෆොන්සේකා මහතාට අවුරුදු කිහිපයක සිට දේශපාලන වශයෙන් ගත්කල නන්නත්තාර වී ඇති එ ජා පක්ෂය ප්‍රමුඛ නඩයට එකතුවීමට යුතුකමක් නැත. මේ නඩයට දැන් චන්ද්‍රිකා කුමාරතුංග ද එක්වී ඇති අතර ජ වි පෙ ඒ සමග පෙළගැසී ඇත. ෆොන්සේකා මහතා ජනාධිපතිවරයට තරග කළහොත් මොවුන්ගේ එකතුවෙන් ඒ මහතාගේ ඡන්ද ප්‍රමාණය වැඩිම වුවහොත් දෙලක්ෂයකින් ඉහළ යනු ඇත. චන්ද්‍රිකා කුමාරතුංගට අද රටේ වික්‍රමබාහු කරුණාරත්නට වඩා ඡන්ද නැත.

සරත් ෆොන්සේකා මහතා එකතු වී ඇති නඩය මෙරට දේශද්‍රෝහී නඩය බව පුන පුනා කිවයුතු නො වේ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සුවච කීකරු නිවට සේවකයා වූ රනිල් වික්‍රමසිංහ හා තම දෙමව්පියනට ද ද්‍රෝහී වූ එවැනි ම නිවට සේවිකාවක වූ චන්ද්‍රිකා කුමාරතුංහ එක් වී රටට කළ කී දෑ ගොන්සේකා මහතා නොදන්වා විය නො හැකි ය. ඔවුන් දෙදෙනා එකතු කරනු ලැබුවේ බ්‍රිතානි නියෝජිතයා වූ ලියම් ෆොක්ස් විසිනි. බ්‍රිතානිය මෙරට බෙදී වෙන් වී තිබූ විජාතික බලවේග එක්සත් කිරීමට යම් ප්‍රමාණයකට එක්සත් කෙළේ ය. රනිල් චන්ද්‍රිකා එක්කිරීම එහි කූටප්‍රාප්තිය විය. ඉන් පසු බ්‍රිතානියේ අවශ්‍යතාවට නොර්වේ මැදිහත් වී ඇති කෙරුණු රනිල් ප්‍රභාකරන් ඊනියා සටන් විරාම ගිවිසුම දක්වා සිදු වූ කරුණු ෆොන්සේකා මහතා නොදන්නවා නොවිය හැකි ය.

තමන්ගේ සෙබළුන්ට සරම උස්සා පශ්චාත් පාර්ශ්වය පෙන්වා සමච්චල් කිරීමට මග පාදා දුන්නේත් තම සෙබළුන් කඳවුරුවල අකර්මණ්‍ය කෙළේත් රනිල් ප්‍රභාකරන් ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස බවත් ඒ ගිවිසුම මගින් බ්‍රිතානියේ වුවමනාවට ප්‍රභාකරන්ට හා කොටින්ට උතුරු හා නැගෙනහිර පළාත් පාවාදීමට රනිල් වික්‍රමසිංහ ක්‍රියා කළ බවත් සරත් ෆොන්සේකා මහතා නොදන්නේ යැයි සිතිය නො හැකි ය. ආණ්ඩුවෙන් සරත් ෆොන්සේකා මහතාට අසාධාරණයක් වන්නට ඇත. එහෙත් ඒ හේතුවෙන් ඒ මහතාට රනිල් චන්ද්‍රිකා හකීම් (අව)මංගල නඩය සමග එකතුවීමට බලපත්‍රයක් නො ලැබෙයි. තමන්ට අසාධාරණයක් වී නම් සරත් ෆොන්සේකා මහතා කළ යුතුව තිබුණේ හමුදා සේවයෙන් විශ්‍රාම

© Prof. Nalin De Silva

ගෙන එක්කෝ නිහඬ ව සිටීම ය. එසේත් නැතහොත් ආණ්ඩුව විවේචනය කරමින් ආණ්ඩුවේ ජාති හිතෛෂී කටයුතුවල දී සහාය දීම ය.

එහෙත් ඒ මහතා ජනාධිපතිවරණයේ දී ලලිත් පෙරමුණෙන් හෝ වෙනත් පක්ෂයකින් හෝ තරග කළහොත් ඒ මහතාට ඉතිහාසයේ හිමිවනු ඇත්තේ කුණු කූඩය පමණකි. ඒ මහතාගේ කැපකිරීම් දක්ෂතා ආදියෙන් දහසකින් එකක්වත් නැති අය මහින්ද රාජපක්ෂ මහතාගේ පිළේ සිට වාසි දිනාගැනීම සඳහා සරත් ෆොන්සේකා මහතාට නිග්‍රහ කරනු ඇත. ඇතැම් විට හිරිහැර කරනු ඇත. කොටි සංවිධානය පැරදවීමෙහිලා ඒ මහතා සිදුකළ කාර්යය තුට්ටු දෙකට දමනු ඇත. මොවුන් සමහර දෙනකු චන්ද්‍රිකා කුමාරතුංගට පමණක් නොව ප්‍රේමදාසට ද සේවය කළහ. ප්‍රේමදාස ජනාධිපති කොටින්ට ආයුධ සපයන විට, පොලිස් නිලධාරීන්ට යටත්වන ලෙස නියෝග කරන විට ඔවුහු ප්‍රේමදාස සමග සිටියහ. මොවුන්ට ඇත්තේ දේශප්‍රේමයක් නොව තනතුරු ප්‍රේමයකි. කිනම් ආණ්ඩුවක් බලයට පත්වුව ද ඔවුහු තනතුරු දරති. කෙසේ වුවත්  බල්ලන් සමග නිදාගත්තවුන් මැක්කන් සමග නැගිටින්නේ යැයි කියමනක් වෙයි. දේශද්‍රෝහි නඩයක් සමග එකතුවීමෙන් සරත් ෆොන්සේකා මහතාට ද මැක්කන් ලැබෙනු වැළැක්විය නො හැකි ය.

සරත් ෆොන්සේකා මහතා මුහුන සමග තරහ වී නාසය කපාගැනීමට සැරසෙයි. අද ඒ මහතාගේ ක්‍රියාව දෙපැත්තක සිට වාසි ලබාගැනීම සඳහා දෙමළ ජාතිවාදීන්, රාජ්‍ය නොවන බැළයන් හා බටහිරයන් ක්‍රියාකරනු පෙනෙයි. මේ වන විට ඊබට් පදනම වැනි ප්‍රසිද්ධ ඊනියා රාජ්‍ය නොවන විදේශීය ආයතන  මහින්ද රාජපක්ෂ මහතාට විරුද්ධව තරග කරන අයකුට ආධාර කරන බව පවසා ඇත. සකල විධ විජාතික බලවේග අද නැවත වරක් එක් වී ඇත. ඒ සියල්ලෝ ම ආණ්ඩුවට පහර දීම සඳහා ඊනියා යුද්ධ අපරාධ චෝදනා ඉදිරිපත්කිරීම සඳහා සරත් ෆොන්සේකා මහතාගේ ක්‍රියා උපයෝගි කරගැනීමට බලාපොරොත්තු වෙති.

ඒ අතර ඩී බී එස් ජෙයරාජ් වැනි මැතක් වන තුරුම කොටි හිතවාදීන් වූ පිරිස් වෙනත් ක්‍රමයක් අනුගමනය කරනු පෙනෙන්නට ඇත. ඔවුන්ගේ අපේක්ෂාව ආණ්ඩුව පැත්තේ සිට සරත් ෆොන්සේකා මහතාට විරුද්ධ ව චෝදනා ඉදිරිපත් කිරීම ය. දැනටමත් ජෙයරාජ්ගේ ලිපියක් වෙබ් අඩවිවල දැකගත හැකි ය. ජෙයරාජ් වැන්නවුන්ට ආණ්ඩුවට ඇති හිතවත් කමක් නැත. ඔවුන් අවසන් වශයෙන් පහරදෙන්නේ ජාතික බලවේගයට හා හමුදාව ලැබූ ජයග්‍රහණයට ය. ෆොන්සේකා මහතාගේ පැත්තේ සිට ආණ්ඩුවට පහර දෙන්නෝ ද ආණ්ඩුව පැත්තේ සිට ෆොන්සේකා මහතාට පහර දෙන්නෝ ද තමන් අවසානයේ බටහිරයන්ගේ හා විජාතික බල වේගවල අනුග්‍රහය ලබන දෙමළ ජාතිවාදීන්ගේ, රාජ්‍ය නොවන බැළයන්ගේ අතකොළු බවට පත්වන බව නො දනිති. දෙපැත්තේ ම දූර්වලකම් ඇත. ඒ දූර්වලකම් හෙළි කිරීමට ජනාධිපතිවරණය යොදා ගැනෙන්නේ නම් බටහිරයන්ට ඊනියා යුද්ධ අපරාධ, මානව හිමිකම් කඩකිරීම් ආදිය ගැන කතාකිරීමට අවස්ථාවක් ලැබෙනු ඇත.  එවැනි ජනාධිපතිවරණයකින් වඩාත්ම පරාජයට පත්වනු ඇත්තේ ජාතික බලවේගය ය.

ජ වි පෙරමුණේ ක්‍රියා කලාපය ගැන ද දැනට වචනයක් කිව යුතු ය. සංධානයකට ඇතුල් වුවත් නැතත් අද ඒ පක්ෂය රනිල් චන්ද්‍රිකා හකීම් (අව)මංගල නඩය සමග එක පෙළට සිට ගනියි.  ඔවුන්ගේ දේශප්‍රේමය ද ජනාධිපතිවරණයේ දී කිරා බැලෙනු ඇත. ඒ අතර ඒ පක්ෂය තවත් පැත්තකින් වෘත්තීය සමිති සාමාජිකයන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා රැකියා විරහිත උපාධිධාරීන් උපයෝගී කරගනිමින් ආණ්ඩුව අස්ථාවර කිරීමේ ක්‍රියා මාර්ගයකට ද අවතීර්ණ වී ඇත. ඔවුන් සිතන්නේ ඔවුන්ට ආණ්ඩුව අස්ථාවර කර සරත් ෆොන්සේකා මහතා මාර්ගයෙන් බලයට පැමිණිය හැකිවේ ය යන්න ද? අද ජ වි පෙරමුණට රාජ්‍ය සේවකයන් අතර හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර හෝ බලයක් නැත. ඒ බව තැපැල් ඡන්දයෙන් ද හෙළි වෙයි. යම් යම් හේතු නිසා සමාජයට වෛර කරන තරුණයන් සුළු පිරිසක්  මගින් ඒ ඒ ආයතනවල නිහඬ බහුතරය තම ආධිපත්‍යයට යටකර ගැනීමේ ක්‍රියා පිළිවෙතක් ජ වි පෙරමුණට ඇත. මේ උපක්‍රමය මැතිවරණවල දී ක්‍රියාත්මක කළ නො හැකි ය. එපමණක් නො වේ. රනිල් චන්ද්‍රිකා හකීම් (අව)මංගල අශුද්ධ සන්ධානය සමග එකට සිටීමෙන් මැතිවරණයේ දී ලැබෙන ඡන්ද ප්‍රමාණය ද  අඩුවනු ඇත. ජනාධිපතිවරණයේ දී පක්ෂයේ මාක්ස්වාදී නොවන ජාති හිතෛෂී හිතවතුන් ජ වි පෙ අත්හැර යෑම වැළැක්විය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva